| 10 ශ්‍රේණිය - බුද්ධ ධර්මය |
|---|
| **දෙවන වාර පරීක්ෂණය (2024)**<br>**පිළිතුරු පත්‍රය**<br>**උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** |

## I. පත්‍රය

| ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 1 | 21 | 2 | 31 | 3 |
| 2 | 1 | 12 | 4 | 22 | 4 | 32 | 4 |
| 3 | 4 | 13 | 3 | 23 | 1 | 33 | 1 |
| 4 | 2 | 14 | 3 | 24 | 3 | 34 | 3 |
| 5 | 1 | 15 | 1 | 25 | 4 | 35 | 2 |
| 6 | 3 | 16 | 4 | 26 | 2 | 36 | 4 |
| 7 | 3 | 17 | 4 | 27 | 3 | 37 | 1 |
| 8 | 4 | 18 | 2 | 28 | 1 | 38 | 3 |
| 9 | 2 | 19 | 3 | 29 | 4 | 39 | 1 |
| 10 | 1 | 20 | 1 | 30 | 2 | 40 | සියලු පිළිතුරුවලට ලකුනු දෙන්න |

- **19 සහ 40 ප්‍රශ්න සඳහා ඕනෑම පිළිතුරකට ලකුණු ලබා දෙන්න.**
-

## II. පත්‍රය

**(01)**

I. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවදි රුවක්

II. රාග චරිත / ද්වේශ චරිත / මෝහ චරිත / ශ්‍රද්ධා චරිත / බුද්ධි චරිත / විතක්ක චරිත

III. " මහණෙනි , මම චේතනාව කර්මය යැයි කියමි "

IV. * දුක්ඛ ආර්ය සත්‍යය.
* දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.

* දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය.
* දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය.

V. * සම්මුති සත්‍යාවබෝධය
* පරමාර්ථ සත්‍යාවබෝධය

VI. සම්මා දිට්ඨි , සම්මා සංකප්ප

VII. * විරමණය / සමාදානය
* වාරිත්‍ර ශීලය / චාරිත්‍ර ශීලය ( පිළිතුරු අතරින් එක් වර්ගයක් )
( සිරිත් ) ( විරිත් )

VIII. * බුදුගුණය : අරහං බුදු ගුණය
* කතුවරයා : මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමි.

IX. * මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.
* කීර්තිය පැතිරීම.
* ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වීම.
* සිහි මුලා නොවී කළුරිය කිරීම.
* මරණින් මතු සුගතියෙහි උපත ලැබීම. ( මේ අතරින් දෙකක් )

X. රුවන්වැලි මහා සෑය , මිරිස වැටිය

(02)

I. කැපවීම, අධිෂ්ඨානය, නිවැරදි තීරණ ගැනීම, ඉවසීම, ආත්ම සංයමය, නොපසුබස්නා උත්සාහය, උපායශීලි බව, නිවැරදි ගමන් මග.......... ( මේ අතරින් දෙකක් )

II. උපත , ශිල්ප හැදෑරීම , සතර පෙර නිමිති දැකීම , නිබ්බුත පද ඇසීම , විවාහය , දුෂ්කර ක්‍රියා කිරීම ......... ( මේ අතරින් තුනක් )

III. සිදුහත් බෝසත් චරිතය අභියෝග වලින් සමන්විත වූවකි. එතුමාගේ දැඩි කැපවීම , අධිෂ්ඨානය , නිවැරදි තීරණ නිවැරදි වේලාවට ගැනීම නිසා තමාද සසරින් එතෙර වී අන් අයද සසරින් එතෙර කරවීමට හැකියාව ලැබුණි. එය පාසල් සිසුන්හට කදිම ආදර්ශයක් සපයයි.
(ශිල්ප හැදෑරීම , තම ආපේක්ෂාව ඉටු කර ගැනීමට වෙහෙසීම , ගැටළු හමුවේ අකම්පිතව මුහුණ දීමට.......මේ ආදී ගුණාංග පාසල් සිසු දිවියට උපයෝගී කර ගැනීමෙන් යහපත් ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබෙන බව දන්වමින් ගලපා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

(03)

I. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

II. " උත්සාහයෙන්,මනා වූ සිහියෙන්,නිවැරදි දෙය,පරීක්ෂාකාරීව කරන,හික්මීමෙන් යුත්,දැහැමිව ජීවත් වන , අප්‍රමාදී වූ පුද්ගලයාගේ යසස වැඩෙන්නේය."

III. යහපත් පුද්ගලයන් වීම සඳහා බුදු දහමෙන් පුද්ගල දිවියට ලබා දෙන උපදේශ අතර කැපී පෙනෙන කරුණු දක්වන ග්‍රන්ථයක් ලෙස ධම්ම පදය සැලකේ. සූත්‍ර පිඨකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළවෙන් දෙවන ග්‍රන්ථයයි. ගාථා 423කින් සමන්විත මෙය වග්ග 26කින් යුක්ත වේ. නිදාන ගාථා 299 කි. බෞද්ධයාගේ අත්පොත ලෙසින් හඳුන්වන මෙය තුළ එන සෑම ගාථාවකින් ම සෑම කරුණකින්ම පුද්ගල දිවිය සාර්ථක කර ගැනීමට උපදේශ සපයන්නකි. (නිදසුන් ඇසුරෙන් පිළිතුර ගළපා ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

(04)

I. * උඩ දිශාව - ගිහි පැවිදි සබඳතාවය
* යට දිශාව - සේව්‍ය සේවක සබඳතාවය

II. * දරුවන් වරදින් මුදවා ගැනීම
* ඔවුන් යහපත් කටයුතුවල යෙදවීම
* ඉගෙනීම් කටයුතුවල යෙදවීම
* ගැළපෙන අවාහ විවාහ කර දීම
* සුදුසු කල්හි සම්පත් පවරා දීම

III. සමාජයක වෙසෙන කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය එම සමාජයේ පදනමය. ඒ අතර ගිහි විනය ලෙසින් දක්නට ලැබෙන සිගාලෝවාද සූත්‍රය මගින් සදිසා නමස්කාරය ඇසුරින් ඒ ඒ සමාජ කණ්ඩායම් මගින් ඔවුනොවුන්ට ඉටුවිය යුතුකම් සමුදායන් දක්වා තිබීමෙන් සමාජ ප්‍රගමනයට දායකත්වයක් ලබා දී තිබේ. ඒවා නිසියාකාරව ඉටුවීමෙන් එක් අංශයක නොව මුළු මහත් සමාජයේ ම දියුණුව සඳහා උපකාරි වේ.
( සමාජ කණ්ඩායම් ඇසුරින් නිදසුන් මත ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.)

(05)

I. අනිත්‍ය , දුක්ඛ , අනාත්ම

II. (10 ශ්‍රේණිය 13 පාඩමට අනුව එක් කරුණක් කෙටියෙන් පහදා ඇත්නම් ප්‍රමාණවත්.)

III. ත්‍රිලක්ෂණය හෙවත් තිලකුණු දහම යනු බුදු දහමේ මූලික ඉගැන්වීමකි. කුමන දේශයක වුවද, කුමන කාලයක වුවද, කුමන ජාතියකට වුවද පොදු වූ ධර්මතාවකි. එනිසා තිලකුණු දහම පිළිබඳ අවබෝධයෙන් සිටීමෙන් අනිත්‍ය වූ දේ නිත්‍ය යැයි නොසිතයි. දුක් සහිත දේ සැප සහිත යැයි නොසිතයි. අනාත්ම වූ දෙය ආත්ම යැයි නොසිතයි. විකුර්ති මානසිකත්වයෙන් තොර වී සත්‍ය දකී. ජයග්‍රාහී මාවත කරා එළඹීමට හැකියාව ඇත. ඒනිසා ඔවුහු මෙලොව දිවිය සාර්ථකව ගෙවන්නට පුරුදු වෙයි.

*අසීමිත ආසාවෙන් තොර වෙයි.

*ලද දෙයින් සතුටු වෙයි.

*මහිච්චතාවෙන් තොරව අල්පේච්චතාවෙන් දිවි ගෙවයි.

*කිසිවකින් කම්පා නොවී මධ්‍යස්ථ වෙයි.

*අගතිගාමී නොවේ.

*අගතිගාමී ගුණයෙන් යුක්තය....... මේ ආදී ප්‍රයෝජන, ගුණාංග දක්වමින් පිළිතුර ගළපා මෙලෙව දිවිය සාර්ථක කර ගන්නා ආකාරය ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

**(06)**

**I.** * නිතර නිතර රැස්වීම
* සමගිව රැස්ව සමගිව සාකච්ඡා කොට සමගිව විසිර යෑම
* නොපැනවූ නීතී නොපැන වීම හා පැනවූ නීතී කඩ නොකිරීම
* වැඩිහිටියන් හා ඔවුන්ගේ අදහස් වලට ගරු කිරීම
* කුල කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම
* වජ්ජී රාජ්‍ය තුළ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා නඩත්තුව පුදසිරිත් පැවැත්වීම
* පූජ්‍ය උතුමන්ට පහසුකම් සැලකීම

( මේ අතරින් දෙකක් )

**II.** අනුන්ගේ යහපත හා අනුන්ගේ දියුණුව පිණිසම කටයුතු කිරීමයි.
මෙත්තා,කරුණා,මුදිතා,උපේක්ඛා යන ගුණ ධර්ම වලින් හිත් පුරවාගෙන රටේ ජනතාව තම දරුවන් ලෙස සලකා අර්ථවත් සේවාවන් සපයයි නම් සමාජය සුඛිත මුදිත වේ.පාලකයා මුළු කාලයම ජනතා සේවයට කැපවීම මින් අර්ථවත් වේ.

**III.** රටේ ජනතාව පාලකයාගේ වත්කමයි. ඔවුන්ට යටපත් සේවාවන් සැපයීම පාලකයා සතු පරම යුතුකමයි.ජනතා සේවය ප්‍රමුඛත්වයෙහි ලා සලකා කටයුතු කිරීමෙන් රට වැසියන්ට සුඛිත මුදිත ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබේ. ඒ සඳහා රාජ්‍ය පාලනයට බෞද්ධ ආගමෙන් ලබාදෙන පිරිවහල ඉතා වැදගත් වන බව පවසමින්,( 10 ශ්‍රේණියේ 22 පාඩමට අනුව පිළිතුර ගළපා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

**(07)**

**I.** සද්ධර්ම රත්නාවලිය - 10 ශ්‍රේණිය( 21 පාඩම )
( 121 පිටුව බලන්න )

**II.** මාතලේ අළුවිහාර සංගායනාව - 10 ශ්‍රේණිය( 19 පාඩම )
( 102 සිට 105 දක්වා පිටු බලන්න)

**III.** දුටුගැමුණු රජතුමා - 10 ශ්‍රේණිය ( 6 පාඩම )
( 37 සිට 39 දක්වා පිටු බලන්න )

**IV.** වටදාගෙය - 10 ශ්‍රේණිය ( 20 පාඩම )
( 111 පිටුව බලන්න )

**( 6 වන ප්‍රශ්නය සහ 07 I, ii, iv ප්‍රශ්න තෙවන වාරයට අදාළය. ළමුන් එම ප්‍රශ්න තෝරාගෙන ඇත්නම් ඔවුන්ට අසාධාරණයක් නොවීමට නියමිත ලකුණු ලබා දෙන්න.)**